# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1401/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 29/08/2024<br>පැය 1805 |

## මාධ්‍ය නිවේදනය

**ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත් කර තිබූ සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජාත්‍යන්තර පොලිසිය මගින් රතු නිවේදන නිකුත් කර තිබූ සැකකරුවෙකු ඩුබායි රාජ්‍යයේ සිට 2024.08.29 වන අද දින අළුයම් කාලයේ දී ගුවන් මගින් මෙරටට රැගෙන ඒමෙන් පසු අත්අඩංගුවට ගන්නා ලදී.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කිතුල්කඩවල කන්ද, අගලවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුට එරෙහිව මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීම, පුද්ගල පැහැරගැනීම් හා හෙරොයින් ළඟ තබා ගැනීම් සම්බන්ධ නඩු කිහිපයක් සඳහා මතුගම ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් වරෙන්තු නිකුත් කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**